**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2019**

**------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඇසළ පෙරහැර භාරයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගැයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිති 01 හි 70 හා 88 යන ඡේදයන්ට අනුව වත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙලට ශේෂ පත්‍රය මඟින් අනාවරණය කර නොතිබුණි. | ද්‍රවශීලතා අනුපිළිවෙලට ශේෂපත්‍රය මගින් අනාවරණය කිරීම පිළිබඳව ඉදිරි වර්ෂයේදී සැලකිල්ලට ගන්නා බව. | ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | ප්‍රමිත අංක 02 හි 9 වන ඡේදයෙන් බැහැරව ඉතිරි කිරීමේ ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් පිළිවෙලින් රු.2,951,495ක් හා රු.21,645ක් ආයෝජන යටතේ දක්වා තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය රු.2,929,849කින් වැඩි වී තිබුණි. | ආයෝජනයක් ලෙස සලකා පෙර වර්ෂවලදීද ගිණුම් තබා ඇති තවත් ඉදිරි වර්ෂයේ ගිණුම් තැබීමේදී එය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.48,591 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂය මැදදී පොලී අනුපාත වෙනස් වීමත්, ලැබිය යුතු පොලිය ගණනය කිරීම සඳහා අවසන් ශේෂය ලබාගැනීමේදී සිදුවී ඇති ප්‍රමාද දෝෂයක් නිසාත් මෙය සිදු වී ඇති බව ද ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී අදාළ ගැලපීම් සිදුකර මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පොලී ප්‍රතිශතය අනුව පොලිය ගණනය කළ යුතු වීම. |
| (ආ) | ඇසළ පෙරහැර භාරයට අයත් මහා භාරකාර දෙපාර්තමේන්තුව භාරයේ පවතින රු.මිලියන 20 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් වර්ෂය තුළදී ලැබිය යුතු මුළු පොලී ආදායම රු.2,249,448 ක් වුවත් රු.1,000,000 ක් ලෙස රු.1,249,488 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සම්පූර්ණ පොලී මුදලම ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ද ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ අංක BD/HRD 101/07/3/2014 හා 2014 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මහාභාරකාර දෙපාර්තමේන්තු වෙන් ගෙවා ඇති පොලී මුදල රු.1,000,000 ක් වන අතර 2019 වර්ෂය සඳහාද එම පොලී මුදල භාරය වෙත ලැබී ඇති බව දන්වා ඇත. | පොලී ප්‍රතිශතය අනුව පොලිය ගණනය කළ යුතු වීම. |
| (ඇ) | ඇසළ පෙරහැර භාරයේ ආරක්ෂක භාරකරු ලෙස පෙරහැර පැවැත්වීම සඳහා භාරය වෙත වසර ගණනක සිට මුදල් ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙරහැර භාරයෙන් අයවිය යුතු ශේෂය ලෙස රු.17,287,452 ක් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ගිණුම් තුළ ඇතුළත් කර තිබුණද ඇසළ පෙරහැර භාරය විසින් එම මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඇසළ පෙරහැර භාරයේ රුපියල් මිලියන 20ක මුදල භාරයේ රක්ෂක භාරකරු ලෙස කටයුතු කළ මහාභාරකාර තැන විසින් ප්‍රමුඛ බැංකුවේ තැන්පත් කර ඇති අතර ඊට අදාළ පොලී මුදල ලෙස වාර්ෂිකව ඇසළ පෙරහැර භාරය වෙත මුදල් ලබාදීම සිදු කළ බව. | ඇසළ පෙරහැර භාරයේ භාරකරු මහා භාරකාර දෙපාර්තමේන්තුව බැවින් ගෙවිය යුතු මුදලක් පවතින්නේද යන්න තහවුරු කරගත යුතු වීම. |
| (ඈ) | මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ඇසළ පෙරහැර භාරය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලද රු. 2,350,000 ක පොලී ආදායමින් අය කර ගනු ලැබූ රු.94,000 ක රාජ්‍ය භාගය මූල්‍ය | මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් භාරයට අදාළ පොලී ආදායමින් සියයට 4 ක් අයකරගත් බව මේ වන තෙක් භාරය වෙත දන්වා නොමැති බවත් 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර | රාජ්‍ය භාගය අයකිරීම් සම්බන්ධයෙන් නිත්‍යානුකූලභාවය පිළිබඳව එකඟතාවයකට පැමිණිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශන තුළින් අනාවරණය කර නොතිබුණි. | භාරය පනතේ 15 (2) වගන්තිය ප්‍රාකාරව මහා භාරකාරවරයාට ගාස්තුවක් ගෙවීමට භාරය යටත් නොවන බවත් වාර්තා කරන අතර මේ පිළිබඳව මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් විමසීමට කටයුතු කරන බව. | |
| (ඉ) | 2019 වර්ෂයේ නිර්වින්දන වෛද්‍යවරුන්ට මිලදී ගන්නා ලද වටිනාකම රු.55,000 ක ඇඳුම් කට්ටල 22 ක් තොග ලෙස ගිණුම්ගත නොකර වියදම් ලෙස ලියා හැර තිබුණි. | නිර්වින්දන කාර්ය මණ්ඩලයට මීට වසර 10 කට පෙර ඇඳුම් කට්ටල ලබා දීමෙන් පසු මෙවර ඇඳුම් කට්ටල ලබා දී ඇත. මෙම ඇඳුම් කට්ටල නැවත භාරය වෙත ලබා ගැනීමට ඉල්ලීමක් කර නොමැත. භාවිතා කරන ලද ඇඳුම් නැවත ගබඩා කර තබාගැනීම ප්‍රායෝගික නොවන බැවින් භාරයේ වියදමක් ලෙස සලකා ඇති බව හා මෙම වියදම වර්ෂයක් පාසා දැරීමට සිදු නොවන බව. | වසර 10 ක් පමණ කාලයක් ප්‍රයෝජනයට ගන්නා බැවින් තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාර පනත | | | |
| 8(1) වගන්තිය | ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත්කර නොතිබුණි. | උපදේශක කමිටුවක් පත්කිරීමේදී එය පත්කළ යුතු වන්නේ ඇසළ පෙරහැර භාරයෙන්ම වන අතර, අතිගරු ජනාධිපතිතුමා විසින් නම්කරනු ලැබූ සාමාජිකයින් තිදෙනෙකුද ඊට ඇතුළත් වේ. මේවන තෙක් ඒ සඳහා තිදෙනෙකු පත්කර නොමැත. එසේ වුවද උපදේශන කමිටුවේ ප්‍රධානියා වන්නේද ඇසළ පෙරහැර භාරයේ ගරු සභාපති, ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තුමාම වන බැවින් අදාළ කටයුතු බාධාවකින් තොරව මේ වන තෙක් ඉටුකර ඇති බව. | පනත ප්‍රකාරව උපදේශක කමිටුවක් පත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>------------------<br>4.1 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරන ලද අයවැය ලේඛනයක් පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඇසළ පෙරහැර භාරය නිශ්චිත රේඛීය අමාත්‍යාංශයක් යටතට අයත්වන බවක් පනතේ සඳහන් නොවන බැවින් හා ඇසළ පෙරහැර භාරය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන කිසිදු අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවක් මගින් වෙන් කිරීමක් සිදු නොවන බැවින්, ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික ඇස්තමේන්තුව ඇසළ පෙරහැර භාරය විසින් අනුමත කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අයවැය අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,757,602 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.263,607 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,021,209 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඇසළ පෙරහැර ආදායම රු.1,889,800කින් අඩුවීම සහ නිර්වින්ධන ඖෂධ, ඇඳුම් හා කාර්ය මණ්ඩල වියදම් රු.177,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 6(ආ) වගන්තිය අනුව, මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇසළ පෙරහැර සඳහා සහභාගීවන කණ්ඩායම් 20 ක් සඳහා (උපරිම) සම්මාන හා මුදල් ත්‍යාග පිරිනමනු ලබන්නේ උක්ත පරමාර්ථය ඉෂ්ඨ කිරීමේ අරමුණින් බව. | පනත ප්‍රකාරව සියලුම අරමුණු ඉටු කර ගැනීමටකළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආසන ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.1,898,050 කින් එනම් සියයට 38 කින් හා බලපත්‍ර ආදායම සියයට 27 කින් අඩුවී තිබුණි. | ආසන ආදායම වැඩිකර ගැනීම සඳහා ආසන පනවන්නන් කැඳවා රැස්වීමක් පවත්වා ඔවුන්ව දිරිගැන්වීමට භාරය විසින් කටයුතු කළද, වීදිවල නිදහසේ පෙරහැර නැරඹීමට අවස්ථාව සැලසී තිබීම හා පාස්කු ප්‍රහාරය හේතුවෙන් නරඹන්නන් අඩුවීම ආසන ආදායම අඩුවීමට හේතුවී ඇති බව. | ආසන ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වීම |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයින් 12 දෙනෙකු විසින් බලපත්‍ර රහිතව ස්ථාන 17 ක් සඳහා ආසන පනවා තිබුණි | බලපත්‍ර ලබා නොගෙන ආසන පනවා තිබූ ස්ථානවලට අදාළව දඩ මුදලක් අයකිරීමට කටයුතු කළ බව. | බලපත්‍ර ලබාදීමේදී නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැයගත ආදායම්,වියදම් හා තත්‍ය ආදායම්, වියදම් සැසඳීමේදී ආදායම් විෂයයන් 03 ක සියයට 30 ක සිට සියයට 49 ක් දක්වා පරාසයක අඩුවීම් ද, වියදම් විෂයයන් 03 ක සියයට 19 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක අඩුවීම් හා වියදම් විෂයයන් 02 ක සියයට 11ක හා සියයට 15ක වැඩිවීම් ද නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | පොලී අනුපාතය වර්ෂය මැදදී වෙනස් වීම ආසන මිලදී ගැනීම වෙනුවට බොහෝ පිරිස් පදික වේදිකාව මත ඇසළ පෙරහැර නැරඹීම, පාස්කු ප්‍රහාරය හේතුවෙන් බලපත්‍ර ප්‍රමාණය අඩුවීම ආදායම අඩුවීමට හේතු වී ඇති අතර, වෙළඳපළ මිල ගණන් වෙනස් වීම මත වියදම් වැඩිවීම සිදුවී ඇති බව . | අයවැය ගත ආදායම් හා වියදම් අපේක්ෂිත පරිදි සිදු නොවන්නේ නම් සංශෝධිත ඇස්තමේන්තුවක් අනුමත කර ගත යුතු වීම. |